# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල)නිළධාරී සංගමය

**ALL ISLAND SAMURDHI DEVELOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE**

**அனைத்து இலங்கை சமுர்த்தி மேம்பாடு (வங்கிகள் நிறுவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்**

**ලි:ප:අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com**

අංක , **68** දෙහිදෙනිය ,පේරාදෙනිය

**எண் 68, டெஹிடேனியா, பெரடெனியா**

2024.07.26

හිතවත් සමෘද්ධි සංවර්ධන නිළධාරී,සමෘද්ධි කළමණාකරු
ඇතුළු සමස්ත සමෘද්ධි නිළධාරී ,සහෝදරයා / සහෝදරිය.

## <u>සැමට අස්වැසිල්ලක් උදෙසා පෙළ ගැසෙමු.</u>

**(කරුණාකර ලිපිය කියවා ඔබගේ ප්‍රතිචාරය සමාජ මාධය ජාලයට නොව අප වෙත දක්වා ඔබගේ යුතුකම ඉටු කරන්න)**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ වසර 29 ක කාලයක් පුරාවට සේවයේ යෙදී සිටි ඔබ සැම අන්කවරදාටත් වඩා ඔබගේ අපගේ සේවාව පිළිබඳව හා ඔබගේ දරු පවුලේ අනාගතය පිළිබඳ දැඩි මානසික පසුබෑමකට පත් වෙමින් සිටින බව සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිළධාරී සංගමය වන අප සංගමය මේ වන විට අවබෝධ කරගෙන සිටී.විශේෂයෙන්ම තව වසර කිහිපයකින් ඔබ අප විශ්‍රාම යාම නැමති තමතමන් තනි තනිව මුහුණ දෙන ඒ අභියෝගාත්මක අවස්ථාවට අදාලව ගොඩනැගී ඇති අවිනිශ්චිතභාවයන් ඉහත කී මානසික පසුබෑම ඉහල නැංවීමට හේතුවී ඇති බව අපගේ විශ්වාසයයි.එලෙස එම තත්වයට පත්ව ඇති ඔබගේ අපගේ ප්‍රාර්ථනාවන් හොදින් තේරුම් ගත් අප වෘත්තීය සමිතිය කැපකිරීම් පෙරදැරිව ඔබ සැමට අස්වැසිල්ලක් ගෙනඒමේ අරමුණින් අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වෘත්තීය සමිති ප්‍රධානීන් වෙත 2024.07.15 දින ලිඛිතව ආමන්ත්‍රණය කළ අතර එම ලිපිය ඔබගේ දැනගැනීම සඳහා පහතින් උපුටා දක්වා ඇත.අප ඉතා සත්භාවයෙන් යොමුකළ එම ලිපිය පළමුව කියවා පසුව අපගේ කරුණු පැහැදිලි කිරීම සමඟ අවංකව එකතුවන ලෙසට පළමුව මෙයින් ආරාධනා කර සිටිමු.

**සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල)නිළධාරී සංගමය**

**ALL ISLAND SAMURDHI DEVELOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION**

**அனைத்து இலங்கை சமுர்த்தி மேம்பாடு (வங்கிகள் நிறுவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்**

**ලි:ප:අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com**

අංක , **68** දෙහිදෙනිය ,පේරාදෙනිය

**எண் 68, டெஹிடேனியா, பெரடெனியா**

2024.07.15

### <u>එකමුතුවී කටයුතු කිරීම සඳහා කරණු ලබන ගෞරවනීය අරාධනයයි !</u>

සහෝදර වෘත්තීය සමිති නායක සහෝදරය,

සමෘද්ධි ව්‍යාපාරයේ ආරම්භක අවධියේ එවකට තරුණ අප අතර පැවති සමඟිය ජවය හා ඒකායන අරමුණු කරා ගමන් කිරීමේ හැකියාව රටේ යහපතට මෙන්ම යම් යම් දේශපාලනික/සමාජීය/සංස්කෘතමය මෙන්ම වෘත්තීය ජයග්‍රහන උදෙසා ඉවහල් වූ බව නොරහසකි.මේ වන විට ඒ තරුණ අප මැදිවියට හා විශ්‍රාම යන වයසට පත්ව ඇති අතර එදා අප අතර තිබූ සමඟිය වෙනුවට අසමඟියද/ඒකායන අරමුණු වෙනුවට පටු කල්ලිවාදී අරමුණුද/ජවය වෙනුවට බයද/ඉතිරිව දැඩි මානසික ව්‍යාකූලත්වයකට පත්වෙමින් පවතින බව නොරහසකි.ඒ නිසාම අපට ලැබියයුතු බොහෝ දෑ නොලැබෙමින් අප සහෝදර නිළධාරීන් ඉතා අසරණ භාවයට පත්වෙමින් පවතී.

නමුත් අපගේ ඒ ආරම්භක අවධියේ යම් යම් දේශපාලනික / සමාජීය / සංස්කෘතික ජයග්‍රහන අත්කර දීමට කැප කලද අපගේ වෘත්තීය ජීවිතවලට ජයග්‍රහණ ඇවැසි මොහොතේ අප සියළු දෙනා අසමඟිව එකිනෙකාට අවලාද නඟමින් නොසිට අපහට එදා නොතිබුන අත්දැකීම් / පරිනතභාවයන් / සම්බන්ධතාවයන් බොහොමයක් ඇති මේ කාල වකවානුවේ සමඟියෙන් සම්මුතියෙන් එකාවන්ව එක තැනකට එක මිටකට ගොනු වන්නට හැකි වුවහොත් තවමත් අප ප්‍රමාද හෝ පරාද නැති බව අවධාරණය කරමු.

| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
|---|---|---|
| එන්.ජේ.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ජේ.වී.බස්නායක |
| දු:අං: 071-2268463 | දු:අං:071-4395535 | දු:අං: 071-8191473 |

අප සැම මොනයම් කරුණු වලට / මතවාද වලට එකඟවිය නොහැකි වුවද අපට / අප දරුවන්ට / අප ආයතනයට මෙන්ම පොදු වෘත්තීය ගැටළු වලට විසඳුම් සෙවීමේදී එයට අදාල කරුණු වලට එක මතයනට පැමිණිය නොහැක්කේ මන්දැයි සමෘද්ධි නිළධාරීන් වන අපගේ සියළු සංගම්වල සාමාජිකයන් ප්‍රශ්ණ කරමින් සිටින මේ මොහොතේ අපද යම් නිළධාරීන් කණ්ඩායමක් වෙනුවෙන් පෙනීසිටින කණ්ඩායම් නායකයින් වශයෙන් ඒ පිළිබඳව තනි තනිවම අපගෙන් විමසා බැලිය යුතු යැයි අවධාරණය කර සිටිමු.

මේ වන විට සමෘද්ධි ව්‍යාපාරය තුල බිහිව ඇති වෘත්තීය සමිති අතර සමෘද්ධි ව්‍යාපාරයේ ක්‍රියාකාරී වෘත්තීය සමිති ලෙස කටයුතු කරණ අප වෘත්තීය සමිති අතර මොනයම් මතවාද තිබුනද සාමාජිකයන්ගේ සුභසිද්ධිය උදෙසා එකතුවී කටයුතු කළයුතු යැයි අප විධායක කමිටුව අප හට පෙන්වා දෙන ලදී.නිහතමානී නායකයින් වශයෙන් ඔවුන්ගේ එම අදහසට ගරු කරමින් එය ක්රියාවට නැංවීම සඳහා

1. සමස්ත ලංකා සමෘද්ධි කළමණාකරුවන්ගේ සංගමය.
2. සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ නිශ්පාදන සහකාර නිළධාරී සංගමය.
3. සමස්ත ලංකා එක්සත් සමෘද්ධි සංවර්ධන නිළධාරී සංගමය.

ඔබ සංගම් හා අප මේ පිළිබඳව සාකච්ඡා කර යම් එකඟතාවයක් තුල අප සමෘද්ධි ව්‍යාපාරයේ නිළධාරී සැමට යහපත් තත්වයක් උදාකළ හැකිදැයි සාකච්ඡා කිරීම සඳහා ඉහත සඳහන් ප්‍රධාන වෘත්තීය සමිති වල ප්‍රධාන නිළධාරීන් 05 දෙනා හෝ තීන්දු තීරණයන්ට අවතීරණ විය හැකි වගකිව යුතු නිළධාරීන් 05 දෙනකු හට එක තැනකට එක්ව පොදු සම්මුතියකට එළඹීම සඳහා ඉතා ගෞරවයෙන් ආරාධනා කර සිටිමු.

දිනය :- 2024.07.23 අඟහරුවාදා දින
වේලාව :-පෙ: ව: 9.30 ට
ස්ථානය :-මහනුවර දලදා මාලිගාව අසල අවන්හල පරිශ්‍රයේදී.

සැලකියයුතුයි.

ඔබ සංගමයේ මේ පිළිබඳ ප්‍රතිචාරය අප ඉතා කඩිනමින් අපේක්ෂා කරමු.

(ස්ථානය හා වෙනත් සංවිධාන කටයුතු වල පහසුව සඳහා 2024.07.19 දිනට පෙර සංගමයේ පැමිණීම තහවුරු කිරීමට කාරුණික වන්න)

---


සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 071-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු:අං: 071-8191473


(මෙම ලිපිය අදාල වෘත්තීය සමිති ප්‍රධානීන් වෙත ලද බවට දුරකථනයෙන් තහවුරු කරගන්නා ලදී.)

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු හා ඔබගේ සේවා පසුබිම මේ මොහොත දක්වා විකාශණය වීමේදී මේ වන විට උදාවී ඇති යම් යහපත් තත්වයක් වේ නම් එයටද,අයහපත් තත්වයක් උදාවී ඇත්නම් එයටද , දෙපාර්තමේන්තුවට අදාල සමස්ත වෘත්තීය සමිති යම් වගකීමක් දැරියයුතු අතර බෝලය පාස්කර මඟහැරිය නොහැකි බව අපගේ අවංක මතය බව අවධාරණය කරමු.

තවද වෙනත් කල්ලි කණ්ඩායම් සල්ලි පිල්ලි ගසමින් , කාලය කා දමමින් , ඔබ අපගේ සියළු ප්‍රශ්ණ නඩු දමා අලකර ඇත.එසේම , කිසිදු වෘත්තීය සමිතියක සාමාජිකත්වය නොලබා අනුන්ගේ පහනින් එළිය බලන මේවන විට සමාජ මාධ්‍ය තුල අටවාගත් විවිධ කල්ලි කණ්ඩායම් සමස්ත වෘත්තීය සමිති වලට දෝෂාරෝපනයන් එල්ල කරමින් සමස්ත නිළධාරීන්ගේ ගැටළු නිරාකරණය කර ගැනීමට ඇති අවස්තාව විනාස කරමින් සිටී.අප නිළධාරීන්ද එයට ආවඩමින් කටයුතු කරණ බව පෙනී යයි.

එසේම ඉබාගාතේ යන ඉහත සඳහන් කළ ඔවුන්ගේ සුබවිහරණය සඳහා අටවාගෙන ඇති කල්ලි කණ්ඩායම් මේ වන විට අප නිළධාරීන්ට ඇතිවී තිබෙන ප්‍රධාන ගැටළුවල තත්වය තීව්‍ර කර අප සියළු දෙනා අගාදයට ගෙනයන තෙක් බලා සිටීමට මෙම ප්‍රධාන වෘත්තීය සමිති වලට හැකියාවක් තිබේද?

මෙම ප්‍රශ්නාර්ථයට විසඳුමක් සෙවීමට කාලය එළඹ ඇත.අප සියළු දෙනාගේ බෙදීම නිසා පාලකයන් ඉතා සතුටින් ඔවුන්ගේ රාජකාරී කටයුතු සිදුකරගෙන යනු ලබන බව පෙනීයන නිසාත් එක්ව කටයුතු කිරීම ඔබ අපගේ ගැටළු වලට එකම විසඳුම බව තේරුම් ගත් නිසාත් අප සංගමය සාමාජික ඔබට වගකිවයුතු වෘත්තීය සමිතියක් ලෙස සාමූහිකව කටයුතු

කිරීම සඳහා සිදුකළ ආරාධනාවට සමස්ත ලංකා එක්සත් නිළධාරීන්ගේ සංගමයෙන් පමණක් යහපත් ප්‍රතිචාරයක් ලද බව ප්‍රකාශකර සිටිමු.
ඒ නිසාවෙන්ම එම හමුව තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය.යහපත් ප්‍රතිචාරයක් දැක්වූ සමස්ත ලංකා එක්සත් නිළධාරීන්ගේ සංගමය සමඟ පමණක් එක්ව කටයුතු කිරීම නැවත කල්ලිවාදයකට මුලපිරීමක් වනු ඇතැයි සිතා එකඟතා යෝජනාව තාවකාලිකව අත්හිටුවන ලදී.කෙසේ වෙතත් වෘත්තීය සමිති නායකයින් තම පටු අරමුණු වෙනුවෙන් කටයුතු නොකළයුතු බව මෙයින් පෙන්වාදෙන අතර සාමාජිකයින්ද තමන් පාවිච්චි කරමින් කටයුතු කරණ වෘත්තීය සමිති පිළිබඳව පැහැදිලි තීරණයන් ගතයුතු බව මෙයින් අවධාරණය කර සිටිමු.පසුගිය අතීතයේ මෙන්ම මින් ඉදිරියටද සැබෑ වෘත්තීය ජයග්‍රහණ ලඟාකර දීමට කිසිඳු වෘත්තීය සංගමයකට නොහැකි බව මෙයින් පෙන්වා දෙන අතර ඔබ අප සියළු දෙනා යහපත් තීරණයක් ගන්නා තෙක් ප්‍රශ්ණය එතනමය.

- ➢ නව සේවක වැටුප අඩු වේද?
- ➢ මුල්සේවා 60 % සහ එයට අදාල අධිභාර ගැටළුව?
- ➢ Option වෙනස් කිරීමට සිදුකර ඇති ඉල්ලීම් වලට කුමක් සිදුවේද?
- ➢ සමෘද්ධි සංවර්ධන නිළධාරී සේවා උසස් වීම් ක්‍රම වේදයට කුමක් සිදුවේද?
- ➢ සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ට ලබා දීමට නියමිත MN-2 වැටුප් කේතය කෝ?
- ➢ කලින් කළ හමන දේශපාලන කුණාටු වලින් අප දෙපාර්තමේන්තුව හා සේවාව රැකගන්නේ කෙසේද?
- ➢ සියළු දෙනාට සාධාරණ මාසික දීමනාවක් ලබා ගන්නේ කෙසේද?
- ➢ ඕනෑම රජයක් සමඟ ගණුදෙණු කිරීම සඳහා වෘත්තීය සමිති එක මේසයක වාඩි නොගන්නේ නම් නිළධාරී ඔබ සැම දේශපාලනයට ඔබව නොවිකුණන එක වෘත්තීය සංගමයක් සමඟ එකතුවී අභියෝග ජයගැනීම වරදක්ද ?
- ➢ ඔබට ඒ සඳහා ආත්ම ශක්තියක් ලැබෙන්නේ කවදාද ?

❖ ඔබගේ ඉහත ගැටළු විසදාදීමට ඔබ නියෝජනය කරණ වෘත්තීය සමිතිය සූදානම්ද ? එසේ නොමැතිනම් ඔබ නියෝජනය කරණ වෘත්තීය සමිතියට බලපෑම් කිරීමට ඔබ සූදානම්ද ? ඔබ වෘත්තීය සමිතිය ඔබගේ බලපෑම් මායිම් නොකරන්නේනම් ඔබ තනිව තීන්දුවක් ගැනීමට සූදානම්ද ? රටේ පාලනය කුමන පක්ෂයක් නියෝජනය කළත් අප වෘත්තියට අදාලව ඔවුන් සමඟ ගණුදෙණු කිරීමට සූදානම්ද ? අප සූදානම්ය.

ඔබට අප පිළිබඳව විවේචන තිබීමට පුළුවන එම විවේචනය සාධාරණ නම් ඔබ පෙන්වා දෙන යහපත් ප්‍රතිචාර වලට අනුකූලව නව ගමනකට අප සූදානම්ය.එය ඔබගේ අවශ්‍යතාවය නම් ඒ සඳහා ඕනෑම කැපකිරීමක් කිරීම සඳහා අත්දැකීම් සහිත අප සංගමය සූදානම්ය.ඔබගේ / අපගේ අප සේවාවේ අනාගත යහපත උදෙසා ඔබගේ මතයට අපගේ සංගමයේ ඉඩක් ඇත.
ඔබගේ ප්‍රතිචාර යහපත් වුවද අයහපත් වුවද ඒ පිළිබඳව ඔබගේ මතය පහත වගුවේ සඳහන් ඔබ දිස්ත්‍රික්කයට අදාල නියෝජිතයාට දැනුම් දෙන්න.ඔබ විසින් අද දින ගන්නාවූ තීරණය ඔබගේ රැකියාවේ මෙන්ම අනාගතයේද තීරණාත්මක සන්දිස්ථානයක් බව තේරුම් ගන්න.
ඔබගේ දැක්ම යහපත් නම් පිවිසෙන්න අපගේ වෙබ් අඩවියට → www.oisbku.com

| අනු අංකය | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් නියෝජිතයාගේ නම | දුරකතන අංකය | |
|---|---|---|---|---|
| 01 | මහනුවර,නුවරඑළිය,අම්පාර මොණරාගල | R.H.M.R.බන්දුල වරකාඋල්ල මහතා | 075 – 492 2721 | |
| | | තිලකසිරි මහතා | 071 – 278 2355 | |
| 02 | කොළඹ,ගම්පහ,කළුතර | A.G.A.M.D.G.ගුණවර්ධන මහතා | 075 – 614 2420 | 071 – 310 2420 |
| 03 | කෑගල්ල,රත්නපුර,බදුල්ල | D.සුදත් ගුණසේකර මහතා | 077 – 671 3956 | |
| | | D.J.සෝමචන්ද්‍ර මහතා | 071 – 813 4264 | |
| 04 | මාතලේ,අනුරාධපුරය පොලොන්නරුව,වව්නියාව | B.D.G.වික්‍රමසිංහ මහතා | 070 – 551 8681 | 076 – 556 6136 |
| | | අජිත් මහතා | 078 – 633 3850 | |
| 05 | ගාල්ල,මාතර,හම්බන්තොට | I.D.A.රවීන්ද්‍ර මහතා | 071 – 995 6228 | 077 – 059 4005 |
| | | හේමචන්ද්‍ර මහතා | 074 – 267 2716 | 071 – 152 5686 |
| 06 | ත්‍රිකුණාමලය,යාපනය,මුලතිව් කිලිනොච්චිය,මඩකලපුව | W.M.B.J.K.වීරකෝන් මහතා | 071 – 108 9605 | |
| 07 | කුරුණෑගල,පුත්තලම | K.B.දිසානායක මහතා | 070 – 529 7770 | 076 – 914 2283 |
| | | R.L.ඒකනායක මහතා | 071 – 197 3325 | 071 – 074 0338 |
| | | Y.M.C.ප්‍රදීප් කුමාර | 071 – 628 1689 | |